# ප්‍රාථමික අංශයේ ගුරුවරුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ගුරු උපදේශක උපාධ්‍යයනය බලපාන ආකාරය පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනය.

ජේ.ජ්.තිලකලතා

සංවර්ධනවේදී විශේෂ උපාධිය (11 පෙළ පන්ති සාමාර්ථ්‍යය) කොළඹ විශ්ව විද්‍යාලය - 1977

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - කොළඹ විශ්ව විද්‍යාලය - 1992

අධ්‍යාපනපති උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය - 1998

UCLIB

540798

540798

University of Colombo Library

*අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ*

*අධ්‍යාපන පීඨයට ඉදිරිපත් කෙරෙන නිබන්ධනය*

*2007*

## සංක්ෂිප්තය

ඉගෙනුම් සමාජය නැමති සංකල්පය වර්තමානයේ ක්‍රියාත්මකව පවතියි. ඒ තුළ ගුරුවරයා විසින් ඉටු කරන ලබන භූමිකාව වෙනත් කවර දෙයකින් හෝ පූරණය කළ නොහැකි තත්ත්වයක පවතියි. පෙර පාසල් අවධියේ සිට උසස් අධ්‍යාපන මට්ටම දක්වා ම ගුරුවරයාට මහත් වූ සංකීර්ණතාවන්ට මුහුණ දෙමින් විවිධ වූ අභියෝග ඔස්සේ තම කාර්යයෙහි නියුක්ත වීමට සිදුව ඇත. මේ සඳහා අවශ්‍ය ශක්තිය ලබා ගත හැකි එක් ප්‍රබල හා සමීප කාර්යයක් වන ගුරු උපදේශක ක්‍රියාවලිය ආශ්‍රිතව ද පවතින්නේ සමාන සංකීර්ණත්වයකි. ඒ මගින් ගුරු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සිදුවන බලපෑම හා ඒවායේ ප්‍රතිඵල විවිධාකාර විය හැක. එනිසා ගුරු උපදේශක ක්‍රියාවලිය පිළිබඳව කෙරෙන ගැඹුරු අධ්‍යයනයකින් පවතින තත්ත්ව ගැන මැනවින් දැන ගැනීමටත් වඩාත් ඵලදායී තත්ත්ව ගොඩ නගා ගැනීමටත් හැකිවනු ඇත.

ප්‍රාථමික අංශයේ ගුරුවරුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ගුරු උපදේශක උපාධ්‍යයන ක්‍රියාවලිය බලපාන ආකාරය සොයා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය විය. මේ සඳහා ප්‍රාථමික ගුරු උපදේශක උපාධ්‍යයන ක්‍රියාවලිය, එයට අයත් සේවාස්ථ සැසි පැවැත්වීම, සහාය ඉගැන්වීම් සිදු කිරීම, ගුරුවරුන් සමග මනා සබඳතා පවත්වා ගැනීම හා ගුරු උපදේශක වෘත්තිය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මේ සම්බන්ධව ගුරුවරුන් ගුරු උපදේශකවරුන් ඇතුළු අනිකුත් අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් ගැටලු හා යෝජනා විමසා බැලීම සඳහා ද අවධානය යොමු කරන ලදී.

විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍යය විමර්ශනය, ප්‍රශ්නාවලි භාවිතය, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මගින් අදාළ තොරතුරු සපයා ගනු ලැබිණි. ශ්‍රී ලංකාවේ පාසල් වර්ගීකරණයට අයත් සියලු ම පාසල් වර්ග නියෝජනය වන පරිදි, අහඹු නියැදි ක්‍රමය යටතේ, බස්නාහිර පළාතේ පාසල් 40 ක් තෝරා ගැනිණි. එම පාසල්වල ප්‍රාථමික ප්‍රධාන අවධි තුන ම නියෝජනය වන සේ තෝරා ගනු ලැබූ ගුරුවරුන් 115 කට හා පළාතේ ප්‍රාථමික ගුරු උපදේශකවරුන් 99 දෙනෙකුට ප්‍රශ්නාවලි ලබා දී දත්ත සපයා ගැනිණි. මෙම ගුරු හා ගුරු උපදේශක නියැදිය අතරින් අහඹු ලෙස තෝරාගත් සියයට 10 දෙනෙකු සමහත්, විදුහල්පතිවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, බස්නාහිර පළාත්

ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ප්‍රධාන ප්‍රාථමික විෂය අධ්‍යක්ෂවරුන්, ජාතික අධ්‍යාපනායතනයේ විෂයමාලා පුහුණුකරුවන් ආදී අනිකුත් අදාළ පාර්ශ්වකරුවන් සමහත් පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගන්නා ලදී.

මේ ලබාගත් දත්ත තව දුරටත් තහවුරු කර ගැනීම සඳහා පර්යේෂකයා විසින් නිරීක්ෂණයෙහි යෙදෙන ලදී. මේ විවිධ ක්‍රම යටතේ ලබා ගන්නා ලද තොරතුරු විස්තරාත්මක සංඛ්‍යාලේඛන ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයේදී හා අර්ථකථනයේදී ප්‍රාථමික අංශයේ ගුරු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට ප්‍රාථමික ගුරු උපදේශක උපාධ්‍යයන ක්‍රියාවලිය බලපානු ලබන බවත්, ප්‍රාථමික ගුරු උපදේශකවරුන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය පිරිසක් බව අදාළ පාර්ශ්වකරුවන් සියලු දෙනා ම විසින් පිළිගනු ලබන බවත් අනාවරණය විය. ගුරු උපදේශක ක්‍රියාවලියට ගුරුවරුන්ගේ මනා අනුකූලතාවක් ඇති බවත්, ගුරු උපදේශකවරුන් විසින් පවත්වනු ලබන සේවාස්ථ සැසි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට බෙහෙවින් බලපාන බවත්, ගුරු උපදේශකවරුන් විසින් පවත්වනු ලබන සේවාස්ථ සැසි සඳහා මනා ගුරු සහභාගිත්වයක් ඇති බවත් අනාවරණය විය.

එසේ වුවත් සේවාස්ථ සැසි පැවැත්වීම, සහාය ඉගැන්වීම් සිදු කිරීම, ගුරුවරයා අවබෝධ කර ගැනීම, පසු නිරීක්ෂණ සාකච්ඡා පැවැත්වීම ආදිය පිළිබඳ පුහුණුවක්, විෂය නිර්දේශ පුහුණුවලට අමතර ව ගුරු උපදේශකවරුන්ට ලබා දීමේ අවශ්‍යතාව පවතින බව තොරතුරු තුළින් හෙළි විය. සේවය ආරම්භයේදී ම ගුරු උපදේශකවරුන්ට උපාධ්‍යයන ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීම යෝග්‍ය බව අදාළ පාර්ශ්වකරුවන් වැඩි දෙනෙකුගේම අදහස විය.

දනට කොට්ඨාසයකට නියමිත ව සිටින ප්‍රාථමික ගුරු උපදේශක සංඛ්‍යාව සහාය ඉගැන්වීම්හි යෙදීම සඳහා ප්‍රමාණවත් නොවන බවත්, ගුරු උපදේශකවරුන් පත් කිරීම ඔවුන්ට නියමිත කාර්යභාරය, ඔවුන් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම, තෘප්තිමත් ව, අභිමානයකින් හා පෙළඹවීමකින් යුතු ව සේවය කළ හැකි පිරිසක් බවට පත් කිරීම හා අන්තර් සබඳතා පවත්වන ආකාරය ආදිය පිළිබඳ ගැටලු තත්ත්ව පවතින බව අනාවරණය විය.

විධිමත් ලෙස මෙම ක්‍රියාවලිය හැඩගස්වා ගැනීම, පවතින සම්පතකින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමකි. එමෙන් ම ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගුරු පෙළඹීම, ගුරු කැපවීම,

ගුරු ක්‍රියාවලියේ ගුණාත්මක බව වර්ධනය, සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණමය වෙනස්කම් යාවත්කාලීන ව පවත්වා ගැනීම ආදී සංවර්ධනය විය යුතු අංශ යෝග්‍ය තත්ත්වවලට පත්කර ගැනීමට හේතුවනු ඇත. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට මෙම අධ්‍යයනයෙන් සිදු වූ අනාවරණ ප්‍රයෝජනවත් වනු ඇත.

ලොව නව ප්‍රවණතා පිළිබඳ නිරන්තර දැනුවත් විමක් හා ඒ අනුව නිරන්තර හැඩ ගැසීමකට ගුරු උපදේශකවරුන්ව ලක් කිරීමේ වැදගත්කම ඉස්මතු විය. ගුරු උපදේශකවරුන් වෙත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට අදාළ නොවන කටයුතු පැවරීම අවම කර නියම උපාධ්‍යායකයින් පිරිසක් බවට පත් කිරීම අවශ්‍යය. ඒ තුළින් අවශ්‍ය මට්ටමේ ගුරු පිරිසක් හා මනා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කළ යුතුව හා සකස් කළ හැකිව ඇත.

## ABSTRACT

The concept of "Learning Society" is now in operation. The role played by the teacher within that concept, cannot be supplemented by any other thing. In educating children from pre-school stage to the level of higher education, the teacher has to perform his duties amidst complex situations, facing various challenges. A strong and immediate factor which could provide the vigor in the aforesaid context is the process of In-service Advisers which however has to face similar complexities. The resultant influence exerted on the process of teacher's learning and teaching may also take various forms. As such an in depth study of the process of teacher counseling will enable to acquire a clear understanding of the existing situations and at the same time build up amore productive status.

The main objective of this study was to ascertain the effect of the process of In service adviser's, instruction on the learning and teaching process of the teachers in the primary section. For this purpose a study was conducted in the spheres of Primary In service adviser's holding of connected in-service sessions, visiting schools, maintaining connections with teachers and the profession of teaching counseling. In this connection attention was also paid to the views, problems and suggestions of the teachers In-service advisers and other connected parties.

For the purpose of this study conducted under the descriptive research method necessary information was obtained through literary investigations, use of questionnaire, interviews and observations.

Forty (40) schools in the Western Province were chosen under the random sample system representing all categories of schools included in the classification of schools in Sri Lanka. Data was collected by issuing questionnaires to 115 teachers chosen so as to

represent the three main primary stages of those schools and 99 primary master teachers in the Province. Information was obtained through interviews conducted with 10 per cent chosen randomly from the said sample of teacher and In service advisers and with Principals. Zonal Directors of Education, Primary Director of Education of the Western Province, Directors for main primary subjects, Curriculum trainers of the National Institute of Education and other relevant parties. For the purpose of getting a further conformation gathered from these various sources were analyzed using descriptive statistical methods.

It was disclosed that in analyzing and defining the data, the primary In-service adviser's instruction process affects the development of the learning-teaching process in the primary sector, and that all parties concerned accept the fact that primary master teachers are a group of personnel essential for the field of education. It was also revealed that the In-service adviser's instruction process had a healthy conformity with the teachers, that the in service sessions conducted by the master teachers had a very great influence towards the development of the learning teaching process, and that the in- service sessions conducted by the master teachers had a good participation by the teachers .

However, the information gathered revealed the existence of a requirement for the master teacher to be given a training in the holding of in-service sessions, visiting schools, understanding the teacher, and holding of post observation discussions, in addition to the training in syllabuses. The majority of the parties concerned held the view that it was most appropriate to provide formal training in the instruction process to the In-service advisers at the commencement of their service.

It has been disclosed that, the cadre of primary In-service advisers prescribed for the particular zone is not adequate for visiting schools, that a problematic situations exist with

regard to the appointment of In-service advisers, their role, their management and supervision, transformation of them into a group of persons who could serve contentedly with a sense of dignity and motivation and the maintenance of inter-relations.

The formal preparation of this process amount to making maximum use of the existing resources. Further the teacher motivation in the primary education sector and teacher dedication will lead to raising to proper standards the sectors requiring development such as the quality of the teaching process and the up-dated maintenance of the reformatory changes. The facts disclosed by this study will be helpful in preparing the background required for same.

The importance of constant awareness about the new trends in the world and the resultant importance of subjecting In-service advisers to a constant preparation were high lighted. There is the need to minimize the assignment of functions not relevant to the development of the process of learning-and teaching, and transform them into a class of proper instructors.

Through this means, the background needed for the creation of a class of teachers of the required level and a beneficial process of learning and teaching, should and could be created.